සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂයය / பாடம் / Subject | බෞද්ධ ශිෂ්ටාචාරය | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

උපදෙස් :
* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
*අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්ණයට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුරු තෝරන්න.

1. බ්‍රාහ්මණ සමයෙහි ක්‍රියාත්මක වූ ආපද් ධර්ම සංකල්පය අනුව ක්ෂත්‍රිය කුලයට නියමිත ආපද් ධර්මය ඇතුළත් නිවැරදි වරණය තෝරන්න.
   1. ඉගෙනීම, රාජ්‍ය පාලනය, බැල මෙහෙවර කිරීම.
   2. ඉගෙනීම, කෘෂි කර්මාන්තය, වෙළඳාම.
   3. යාග කරවීම, කෘෂි කර්මාන්තය, වෙළඳාම.
   4. ඉගැන්වීම, රාජ්‍ය පාලනය, වෙළඳාම.
   5. යාග කරවීම, කෘෂි කර්මාන්තය, කාමයෙහි නොඇලීම.

2. බ්‍රාහ්මණ දහමෙහි ප්‍රධාන පිළිවෙතක් වූ " යාගය" සම්බන්ධයෙන් වඩාත් නිවැරදි පිළිතුර සහිත වරණය තෝරන්න.
   1. වේද පාඨ ගායනා කරන පූජකයා හෝතෘ නම් වේ.
   2. සෑම කුලයක අයෙකුටම යාග කළ හැකිය.
   3. යාගය සඳහා මහා බ්‍රහ්මයාගේ සහභාගීත්වය අනිවාර්ය වේ.
   4. කුලවත් කාන්තාවන්ට පමණක් යාග සිදු කළ හැකිය.
   5. බ්‍රහ්ම සහව්‍යතාවය සඳහා ඇති එකම මාර්ගයයි.

3. ප්‍රධාන වෛදික ඉගැන්වීමක් වූ ආශ්‍රම ධර්ම වලට අදාළ ප්‍රකාශ කිහිපයක් පහතින් දක්වා ඇත.
   A - බ්‍රහ්ම සහව්‍යතාවය අපේක්ෂාවෙන් පිළිවෙත් පිරිය යුතුය.
   B - මුණි ව්‍රතය පිරීම සඳහා වනගත විය යුතුය.
   C - පවුල් ඒකකයට පුතකු බිහිකර දිය යුතුය.
   D - කාමභෝගී ජීවිතයෙන් සම්පූර්ණයෙන්ම ඉවත් විය යුතුය.
   ඉහත ප්‍රකාශ අතරින් වානප්‍රස්ථ ආශ්‍රමයට අදාළ වඩාත් නිවැරදි ප්‍රකාශය ඇතුළත් පිළිතුර වන්නේ,
   1. A සහ B    2. A සහ D    3. B සහ C
   4. B සහ D    5. C සහ D

4. විමුක්ති සාධනයට ස්ත්‍රීත්වය බාධාවක් කොට සැලකූ බ්‍රාහ්මණ ආකල්පය ප්‍රතික්ෂේප කරන බුදු සමය පෙන්වා දෙන්නේ විමුක්ති සාධනය සඳහා ස්ත්‍රීත්වය බාධාවක් නොවන බවයි. ඒ බව වඩාත් හොඳින් තහවුරු වන්නේ
   1. ථෙරී ගාථාවල දැක්වෙන භික්ෂුණීන්ගේ ප්‍රකාශ මඟිනි.
   2. මවක වශයෙන් වන්දනීය තත්වයක් කාන්තාවන්ට උදාකර දීමෙනි.
   3. බිරිඳක් වශයෙන් කාන්තාවන්ගේ අයිතිවාසිකම් තහවුරු කරදීමෙනි.
   4. බිරිඳ ස්වාමියාගේ පරම මිතුරිය ලෙස දැක්වීම මඟිනි.
   5. සියළු සමාජීය වගකීම් කාන්තාවන්ට හිමි කර දීම මඟිනි.

5. අතින් දණ්ඩක් දරා සිටි අත්තකිලමතානුයෝගීව උග්‍ර තපස් ව්‍රත අනුගමනය කරමින් විමුක්තිය සොයා ගිය භාරතීය ශ්‍රමණ ගුරුකුලය ....................................... නම් විය.

1. නිගන්ථ
2. පරිබ්‍රාජක
3. ආජීවක
4. ජටිල
5. තාපස

6. බුද්ධ කාලීන භාරතීය සමාජය තුළ සිටි ෂට් ශාස්තෘන් ගේ ඉගැන්වීම් සම්බන්ධ ප්‍රකාශ කීපයක් පහතින් දැක්වේ.

A - දන් දෙමින් දෙවමින් ගංගා නදියෙහි උතුරු තෙරට ගියද පලක් නැත.

B - සත්වයන්ගේ කෙලෙසීමට හෝ පිරිසිදු වීමට හේතුවක් හෝ ප්‍රත්‍යයක් නැත.

C - පෘතුවියේ සියලු ප්‍රාණීන් මරා එකම මස් ගොඩක් කළද විපාකයක් නැත.

D - දානයෙන්, ඉන්ද්‍රිය දමනයෙන්, සංවරයෙන් සිදුවන පිනක්ද නැත.

E - සතර මහා භූත වලින් හට ගන්නා කිසිවෙකුටත් මරණින් මතු උප්පත්තියක් නැත.

ඉහත ප්‍රකාශ අතරින් පූරණ කස්සප ශාස්තෘවරයාගේ දර්ශනයට ගැලපෙන ප්‍රකාශ සහිත නිවැරදි වරණය කුමක්ද ?

1. A, B සහ C
2. A, C සහ D
3. B, C සහ D
4. B, D සහ E
5. C, D සහ E

7. ක්‍රි.පූ. 6 වන සියවස යනු භාරතීය සමාජය තුළ විවිධ පරිවර්ථන රාශියක් සිදු වූ සමාජ යුගයකි. මෙම පරිවර්ථන ක්‍රියාවලිය තුළ දේශපාලන සංස්ථාව කේන්ද්‍ර කර ගෙන සිදුවූ ප්‍රධානතම ප්‍රවණතාවයක් ලෙස හඳුනා ගත හැක්කේ

1. රාජාණ්ඩු පාලනය අභිබවා සමූහාණ්ඩු පාලනය ජනප්‍රිය වීමයි.
2. වංශාධිපතීන්ගේ සාමූහික පාලනය ජනප්‍රිය වීමයි.
3. අධිරාජ්‍යවාදී සංකල්පය පාලකයින් විසින් බැහැර කිරීමයි.
4. සෑම රාජාණ්ඩු පාලකයෙක්ම බුදු දහමට අනුග්‍රහය දැක්වීමයි.
5. රාජාණ්ඩු පාලනයේ නැඟීම හා ගෝත්‍රික පාලනයේ බිඳ වැටීමයි.

8. භාරතීය සමාජය තුළ සිදුවූ වාණිජකරණයේ ප්‍රතිඵලයක් වූයේ සමුද්‍ර මාර්ග ඔස්සේ අන්තර් ජාතික වශයෙන් වෙළඳ කටයුතු සිදුවීමයි. මෙහිදී වෙළඳ වරායවල් කීපයක්ද බිහිවුනු අතර භාරතය තුළ එසේ බිහිවූ එක් ප්‍රසිද්ධ වෙළඳ වරායක් වූයේ,

1. තාම්‍රලිප්ත
2. මහිස්මතී
3. තම්බපණ්ණි
4. ශාවස්තිය
5. කුසිනාරා

9. හැම ගුණයෙන් නදා - සම වැඩි සතකු හැමදා
දියතෙහි නැති සඳා - ..................... යන බුදුගුණ අලංකාර පද්‍යයෙන් කියවෙන බුදු ගුණය වන්නේ,

1. සුගත
2. ලෝකවිදූ
3. අනුත්තර
4. සත්තා
5. භගවා

10. පහත සඳහන් අන්‍ය ආගමික පිරිස් අතරින් බුදුරජාණන් වහන්සේගේ ගුණ අගය කළ පුද්ගලයින් අතරට ගත නොහැකි පුද්ගලයෙකු වන්නේ,

1. සෝණදණ්ඩ බ්‍රාහ්මණ
2. කසී භාරද්වාජ බ්‍රාහ්මණ
3. වච්ඡගොත්ත පරිබ්‍රාජක
4. පොට්ඨපාද පරිබ්‍රාජක
5. සකුළුදායි පරිබ්‍රාජක

11. බුදුරජාණන් වහන්සේ විවිධ ඉගෙනුම් ක්‍රම ශිල්ප භාවිතා කරමින් දහම් අවබෝධ කළ සිද්ධි කීපයක් පහතින් දැක්වේ.

A - රාහුල කුමරුට දහම් අවබෝධ කරවීම.

B - නන්ද කුමරුට දහම් අවබෝධ කරවීම.

C - චුල්ල පන්තක හිමිට දහම් අවබෝධ කරවීම.

D - රජ්ජුමාලාට දහම් අවබෝධ කරවීම.

E - ඛේමා බිසවට දහම් අවබෝධ කරවීම.

ඉහත සිද්ධි අතරින් දෘෂ්‍යාධාර භාවිතා කරමින් දහම් අවබෝධ කරන ලද අවස්ථා සඳහා නිදසුන් ලෙස දැක්විය හැක්කේ.

1. A, B සහ C 2. A, C සහ E 3. B, C සහ D
4. B, C සහ E 5. C, D සහ E

12. “ මිනිස් වර්ගයාගෙන් වැඩිම සංඛ්‍යාවකින් පූජා ලද තැනැත්තා ලෙස ඉතා පහසුවෙන්ම වෙන් කොට දැක්විය හැක්කේ බුදුරජාණන් වහන්සේය ” යනුවෙන් බුදුරජාණන් වහන්සේව අගය කරන ලද්දේ කවුරුන්ද?

1. මහාචාර්ය සෝන්ඩර්ස් 2. එඩ්වින් ආර්නෝල්ඩ්
3. බර්ට්‍රන්ඩ් රසල් 4. ඇල්බට් අයින්ස්ටයින්
5. මහාචාර්ය ලක්ෂ්මී නරසු

13. බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයින්ට ප්‍රදානය කරන ලද තනතුරු කීපයක් පහතින් දැක්වේ.

A - ධර්ම භාණ්ඩාගාරික

B - බහුශ්‍රැත භික්ෂූන් අතර අගතනතුර

C - අවබෝධ ශක්තිය ඇති භික්ෂූන් අතර අග තනතුර

D - වීර්ය සම්පන්න භික්ෂූන් අතර අග තනතුර

E - ස්මෘති සම්පන්න භික්ෂූන් අතර අග තනතුර

ඉහත තනතුරු අතරින් ආනන්ද හිමියන් ලැබූ තනතුරු නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

1. A සහ B 2. A, B සහ C
3. B, C සහ D 4. A, B, C සහ D
5. A, B, C, D සහ E

14. කේසපුත්තයේ කාලාම වැසියන් උදෙසා බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද කාලාම සූත්‍රය මූලික බුද්ධ දේශනා අතරින් වඩාත් සුවිශේෂී කොට සැලකීමට හේතු වන කරුණක් වන්නේ, එමඟින්,

1. අදේව වාදය හා අනීශ්වර වාදය බැහැර කර ඇති නිසාය.
2. අන්‍ය ආගමික මතවාදයන් සියල්ල බැහැර කර ඇති නිසාය.
3. අන්ධානුකරණයෙන් වෙන්ව ස්වච්ඡන්දතාවයට මග පෙන්වා ඇති නිසාය.
4. සිතීමට හා විමසීමට පූර්ණ අසීමිත නිදහසක් හිමි කර දී ඇති නිසාය.
5. තමාගේ මතය පමණක් නිවැරදි යැයි සැලකීමට මග පෙන්වා ඇති නිසාය.

15. බුද්ධ කාලීන භාරතයේ පැවති ආගමික ඉගැන්වීම් අතරින් පුද්ගල ස්වාධීනත්වයට හානිකර ඉගැන්වීමක් ලෙස සැලකිය නොහැක්කේ

1. ඊශ්වර නිර්මාණ වාදයයි. 2. පුබ්බේකතහේතු වාදයයි.
3. අහේතු අප්‍රත්‍යවාදයයි. 4. හේතුඵල වාදයයි.
5. නියති වාදයයි.

16. සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය සම්බන්ධ බෞද්ධ මතය විස්තර වන ප්‍රධාන මූලාශ්‍රය වන්නේ අග්ගඤ්ඤ සූත්‍රයයි. එම සූත්‍රයට අනුව මානව සමාජය සංවර්ධනය වීමේදී ක්‍රමවත් සමාජ පරිපාලනයක් ඇති කිරීමට මුල් වූයේ,

1. දරිද්‍රතාවය යි.
2. මහජන මතය යි.
3. කාමසේවනය යි.
4. පෞද්ගලිකත්වය යි.
5. දේපල තණ්හාව යි.

17. ප්‍රජා සුභ සාධනය සලස්වමින් සුහද හා ප්‍රියමනාප ආමන්ත්‍රණයෙන් යුතුව ජාති කුලගෝත්‍ර ආදිය නොසලකා පරාර්ථය උදෙසා කටයුතු කිරීම පාලකයාගේ වගකීමකි. ඉහත විස්තර සමඟ වඩාත් ගැලපෙන්නේ

1. සතර සංග්‍රහ වස්තුව.
2. දසරාජ ධර්මය.
3. දස සක්විති වත.
4. සප්ත අපරිහානි ධර්මය.
5. සතර බ්‍රහ්ම විවරණ.

18. පහත දක්වා ඇති ප්‍රකාශ අතරින් හොඳ නරක නිශ්චය කිරීමෙහිලා භාවිතා කළ හැකි නිර්ණායකයක් ලෙස වඩාත් ගැළපෙන පිළිතුර සහිත වරණය කුමක්ද ?

1. තමාට නොපෙනෙන දෙවියන් අන් කවරකුවත් නොව තමාමය.
2. තමන්ට තමන්ව ප්‍රිය නම් තමාවම රැක ගත යුතුය.
3. තමාට අනුන්ට යන දෙපක්ෂයටම වැඩ දායක ක්‍රියා කරන්න.
4. තමා පහනක් කොට වසන්න. අන් අයගේ පිහිට නොපතන්න.
5. තමාගේ පිහිට තමාමය. අන්‍යයන්ගෙන් සරණක් නැත.

19. භික්ෂූන් වහන්සේලාට මෙන්ම ගුරුවර, වැඩිහිටියන්, දෙමව්පියන්, වයෝවෘධ ගුණෝවෘධ උතුමන්, ආගන්තුකයින්, ගිලනුන් හා දුගී මගී පුද්ගලයින් විෂයෙහි කළ යුතු සැලකිලි උපස්ථාන දක්වමින් ඉවසීමෙන් තිදොර සංවරව ක්‍රියා කිරීම,

1. දානය නම් වේ.
2. සීලය නම් වේ.
3. පත්තිදාන නම් වේ.
4. පත්තානුමෝදනා නම් වේ.
5. වෙයාාවච්ච නම් වේ.

20. මහිච්ඡතාවයෙන් මිදී ගත කරන අල්පේච්ඡ දිවිය බුදු සමය අගය කරන අතර එය පුද්ගල ජීවිතයේ ගුණාත්මක සංවර්ධනයට අදාළ ප්‍රතිඵල ගණනාවක් ගෙන දෙන්නකි. අල්පේච්ඡතාවය හේතු කොට ගෙන ඇතිවන ප්‍රතිඵල අතරට අයත් නොවන ප්‍රතිඵලයක් වන්නේ,

1. යථා ලාභ සන්තුෂ්ටියෙන් කටයුතු කළ හැකි වීම
2. අධික තෘෂ්ණාවෙන් මිදිය හැකි වීම
3. ගැටුම් වලින් තොර සාමකාමී සමාජයක් නිර්මාණය වීම
4. කෙලෙස් වලින් මිදී විමුක්තිය උදාකර ගත හැකි වීම
5. අතෘප්තිකර ජීවිතයෙන් මිදීමට හැකියාව ලැබීම

21. බුදු දහම හා පරිසරය අතර ඇති සම්බන්ධතාවයට අදාළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - බුදුරදුන් ඉසිපතනය මිගදායේදී පළමු වස් කාලය ගත කිරීම
B - පැලවන බීජ සිඳීම භික්ෂූන්ට ආපත්ති ලෙස දක්වා තිබීම
C - බෝසතුන් වසර හයක් වනගතව අරිය පර්යේෂණයෙහි යෙදීම.
D - ජලයට මූත්‍ර කිරීම, මලපහ කිරීම, භික්ෂූන්ට තහනම් කිරීම
E - අධික මාංශ පරිභෝජනය බුදු දහම ප්‍රතික්ෂේප කිරීම

ඉහත ප්‍රකාශ අතරින් පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ සංකල්පය වඩාත් හොඳින් තහවුරු වන ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.

1. A, B සහ D　　2. A, D සහ E　　3. B, D සහ E
4. B, C සහ D　　5. C, D සහ E

22. බුදු සමය ස්වභාව සෞන්දර්ය මෙන්ම නිර්මාණාත්මක සෞන්දර්ය ද ඉතා ඉහළින් අගය කර ඇති බවට සාධක මූලික සූත්‍රවල පවා බහුලව දැකිය හැකිය. එම සාධකවලට අනුව සෞන්දර්ය සම්බන්ධ බෞද්ධ සංකල්පයෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ,

1. බුද්ධ ශ්‍රාවක ශ්‍රාවිකාවන්ට පමණක් සීමා වීම.
2. උපාදාන ග්‍රහනයෙන් තොරව වින්දනය කළ යුතු වීම.
3. නිකලෙස් ඇසින් වෙන්ව සුන්දරත්වය වින්දනය කළ යුතු වීම.
4. අනුපදානයෙන් තොරව අත්විඳිය යුතු වීම.
5. නිකලෙස් උතුමන්ට පමණක් අත්විඳිය හැකිවීම.

23. සම්පත් පරිභෝජනයෙහිලා බුදු සමය පරිභෝජන දර්ශනයක් ඉදිරිපත් කර ඇති අතර එහිදී “ අමුච්ඡිතෝ ” යනුවෙන් දක්වා ඇත්තේ,

1. මුලාවට පත් නොවීමයි.　　2. ගැති නොවීමයි.
3. ඇලී ගැලී නොසිටීමයි.　　4. ආදීනව දැකීමයි.
5. අසාහසික බවයි.

24. දැහැමින් ඉපයීම, තමා සැපවත්වීම, පරිත්‍යාග කිරීම, ගිජුකමින් තොරව පරිහරණය කිරීම යනුවෙන් ධනය ඉපයීම හා පරිහරණයට අදාළ මූලික උපදෙස් හතරක් ............................................ සූත්‍රයේ දක්වා ඇත.

1. සිගාලෝවාද　　2. පත්තකම්ම　　3. රාසිය ගාමිණී
4. ව්‍යග්ඝපජ්ජ　　5. වණිජ්ජා

25. “ නිවැරදි කාය, වාග්, මනෝ කර්මයන්ගෙන් යුක්ත වූ ආර්ය ශ්‍රාවකයා සැපයට පැමිණෙයි” මෙසේ විස්තර වන්නේ,

1. අත්ථි සුඛයයි　　2. භෝග සුඛයයි　　3. අනණ සුඛයයි
4. අනවජ්ජ සුඛයයි　　5. නිරාමිස සුඛයයි

26. සිගාලෝවාද සූත්‍රයේ සදිසා නමස්කාරයේ එන සමාජ කණ්ඩායම් දෙකකට අදාළ යුතුකම් හා වගකීම් කිහිපයක් පහතින් දැක්වේ.

❖ යහපත් සිතින් අනුකම්පා කිරීම
❖ මැනවින් හික්මවීම
❖ පවින් වැළැක්වීම
❖ අසා නොමැති දෙය කියා දීම
❖ තම මිත්‍රයින්ට හඳුන්වා දීම

ඉහත යුතුකම් හා වගකීම් අදාළ සමාජ කණ්ඩායම් දෙක වන්නේ,

1. පැවිදි පක්ෂය හා ගුරුවරුන්　　2. ගුරුවරුන් හා මව්පියන්
3. සේවකයින් හා ගුරුවරුන්　　4. මිතුරන් හා පැවිදි පක්ෂය
5. පැවිදි පක්ෂය සහ මව්පියන්

27. “ ජයං වේරං පසවති ........” යන ධම්මපද ගාථා පාඨයෙන් පෙන්වා දෙන උපදේශය සහිත නිවැරදි වරණය තෝරන්න.

1. තමාට අහිත වූ අයහපත් දේ පහසුවෙන් කළ හැකිය.

2. පව්ටු නරක මිතුරන් ඇසුරු නොකළ යුතුය.

3. ක්‍රෝධ කරන්නා ක්‍රෝධ නොකිරීමෙන් දිනිය යුතුය.

4. දිනන්නා පරදින්නා තුළ වෛරය ඇති කරයි.

5. අනර්ථ සිදු කරන වචන දාහක් වුවත් උතුම් නැත.

28. බුදුරජාණන් වහන්සේ ප්‍රථම ධර්ම දූත පිරිස අමතා දේශනා කරන ලද “චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය ” යන පාඨයේ අර්ථයට ගැලපෙන නිවැරදි පිළිතුර තෝරන්න.

1. “ මහණෙනි, මුල මැද අග පරිසමාප්තව මැනවින් දහම් දෙසන්න”

2. “ මහණෙනි, දෙව් මිනිසුන්ගේ හිත සුව පිණිස දෙදෙනෙක් එකමඟ නොයන්න”

3. “ මහණෙනි බොහෝ දෙනාගේ හිත සුව පිණිස දහම් චාරිකාවේ යෙදෙන්න. ”

4. “ මහණෙනි බ්‍රහ්ම චර්යාවෙහි හැසිරෙමින් මනාකොට දහම් දෙසන්න.”

5. “ මහණෙනි, ගම් නියම් ගම්හි සැරිසරමින් අසරණ වූවන්ට දහම් දෙසන්න.”

29. ධර්මය හා විනය එක්රැස් කොට, සංග්‍රහ කොට සංගායනා කිරීම පිළිබඳ පූර්වාදර්ශය බුදුරජාණන් වහන්සේ ධරමාණ අවදියේ සිටම සංවර්ධනය වූවක් බව සංගීති සූත්‍රය, දසුත්තර සූත්‍රය , පාසාදික සූත්‍රය ආදී මූලාශ්‍රයන් මගින් ප්‍රකට වෙයි. මෙම තොරතුරු අනුව ගම්‍ය වන්නේ,

1. බුදුරජාණන් වහන්සේ ජීවමාන අවධියේදීද සංගායනා පවත්වා ඇති බවයි.

2. සංගීති සංකල්පය බුදුරජාණන් වහන්සේ විසින්ම දේශනා කරන ලද්දක් බවයි.

3. ධර්ම විනය ආරක්ෂා කර ගැනීමේ වගකීම භික්ෂූන් වහන්සේලාට පවරා ඇති බවයි.

4. සසුනෙහි චිර පැවැත්මට විනය නීතිවල අවශ්‍යතාවය පෙන්වා දී ඇති බවයි.

5. ධර්ම විනය කොටස් කිරීමේ අවශ්‍යතාවය බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇති බවයි.

30. ථෙරවාදී ශාසන ඉතිහාසය තුළ සඳහන් වන ප්‍රධාන ධර්ම සංගායනා වලට අදාළ ප්‍රතිඵල කිහිපයක් පහතින් දැක්වේ.

A - අලජ්ජී පාපී භික්ෂූන් දසදහසක පිරිසක් සසුනින් නෙරපා දැමීම.

B - මහායාන බුදු දහම ඇතිවීමේ මූලාරම්භය සනිටුහන් වීම.

C - දිගු කලක් ඇණහිට තිබූ ශාසනික පිළිවෙත් නැවත ආරම්භ කිරීම.

D - දුසිල් මහණුන් හැට දහසක පිරිසක් සසුනෙන් නෙරපා දැමීම.

E - පළමුවරට බුදු සසුන නිකාය වශයෙන් කොටස් දෙකකට බෙදී යාම

ඉහත කරුණු ඇසුරින් දෙවන සංගායනාවේ ප්‍රතිඵල පමණක් ඇතුළත් වන පිළිතුරු සහිත වරණය තෝරන්න.

1. A, B සහ C　　2. A, B සහ E　　3. B, C සහ D
4. B, D සහ E　　5. C, D සහ E

31. ධර්මාශෝක රාජ්‍ය පාලන සමය වන විට විවිධ හේතු සාධක කරණ කොට ගෙන බුදු සසුන පරිහාණියට පත් වෙමින් පැවති බව ඓතිහාසික වාර්තාවන්ගෙන් සනාථ වෙයි. ඒ සඳහා බලපෑ ප්‍රමුඛ තම හේතුව ලෙස සැලකිය හැක්කේ,

1. අන්‍ය ආගම් වඩාත් පුළුල් තත්වයකට පත්ව තිබීමය.
2. සිල්වත් භික්ෂූණ් වහන්සේලා විශාල පිරිසක් සසුනින් ඉවත් වීමය.
3. භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය ප්‍රත්‍ය පහසුකම් නොලැබී යාමය.
4. නිසි රාජ්‍ය අනුග්‍රහයක් බුදු සසුනේ උන්නතිය විෂයෙහි නොලැබීමය.
5. ලාභ සත්කාර අපේක්ෂාවෙන් අන්‍ය තීර්ථකයින් විශාල පිරිසක් සසුනට ඇතුළත්ව සිටීමය.

32. කීර්තිමත් බෞද්ධ අධ්‍යාපන ආයතනයක් ලෙස ප්‍රකට වූ නාලන්දා විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ සෑම ශිෂ්‍යයෙකුටම පෞද්ගලික ගුරුවරයෙකු සිටි බවට තොරතුරු ඇති අතර ශිෂ්‍යාගේ ...................................................... පිළිබඳ භාර කාරත්වය ඔහුට හිමි විය.

1. විනය හා හැසිරීම
2. ආහාර හා නේවාසික
3. අධ්‍යාපනය හා හික්මීම
4. පෞරුෂත්වය ගොඩ නැඟීම
5. ප්‍රවේශ කටයුතු

33. පණ්ඩුකාභය රජු අභය වැවේ පහළ කෙළවරෙහි දෙවොලක් කරවන ලදැයි සඳහන් වන්නේ කවුරුන් උදෙසාද ?

1. කාලවේල යක්ෂයා
2. වළවාමුඛී යක්ෂණිය
3. ජුතින්දර යක්ෂයා
4. චිත්තරාජ යක්ෂයා
5. පශ්චිම රාජිනී යක්ෂණිය

34. මහින්දාගමනයට පෙර සිටම ලක්දිවට බුදු දහමේ ආභාෂය ලැබුණු බවට ජනප්‍රවාදයේ තොරතුරු ඇත. එවැනි සාධක කිහිපයක් පහතින් දැක්වේ.

A - බුදු රදුන් සමනල කඳු මුදුනේ සිරිපතුල සටහන් කිරීම.

B - මනි අක්ඛික නා රජු ප්‍රධාන පිරිස බුදු දහම වැළඳ ගැනීම.

C - තපස්සු භල්ලුක වෙළඳුන් ගිරිහඬු සෑය කරවීම.

D - චූලෝදර මහෝදර අතර වූ ගැටුම සමත කිරීම.

E - යක්ෂ ගෝත්‍රකයින් විශාල පිරිසක් බුදුන් සරණ යාම.

ඉහත කරුණු වඩාත් පැරණිතම සාධකයේ සිට අනුපිළිවෙලින් පෙළ ගැස්වූ විට ලැබෙන නිවැරදි අක්ෂර කාණ්ඩය සහිත වරණය කුමක්ද ?

1. A, B, D,E, C
2. B, C, E, A, D
3. C, E, D, B, A
4. D, E, C, A, B
5. E, A, D, B, C

35. පහත සඳහන් ප්‍රකාශ අතරින් දෙවනපැතිස් රජුගේ ශාසනික සේවයට අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.

1. චේතියගිරියේ අට සැට ලෙන් ඉදිකර වස් විසීමට පහසුකම් සැලසීම.
2. භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් දක්ඛිණගිරි විහාරය කරවා පූජා කිරීම.
3. විනය සංගායනාවක් පවත්වා ශාසන චිරස්ථිතියට දායකත්වය දීම.
4. මහා විහාර සීමා පිහිටුවා මහා විහාරය ඉදිකර සසුනට පිළිගැන්වීම.
5. භික්ෂුණීන් වහන්සේලා වෙනුවෙන් හත්ථාළ්හක මෙහෙණවර කරවීම.

36. ලක්දිව ප්‍රථම වරට " මාඝාත ආඥාව" පනවමින් සත්ව ඝාතනය නීතියෙන් තහනම් කිරීමට කටයුතු කරන ලද්දේ,

1. නිශ්ශංක මල්ල රජු ය.
2. හතරවන මිහිඳු රජු ය.
3. මහා පරාක්‍රමබාහු රජු ය.
4. සද්ධාතිස්ස රජු ය.
5. ආමණ්ඩ ගාමිණී රජු ය.

37. මහින්දාගමනයෙන් අනතුරුව ලක්දිව ථෙරවාදී බුදු දහමෙහි කේන්ද්‍රස්ථානය ලෙස සංවර්ධනය වූ මහා විහාරය ප්‍රධාන ආරාම පහකින් සමන්විත විය. ඒ හා සම්බන්ධ නිවැරදි වරණය කුමක්ද ?

1. මහා විහාරය, ථූපාරාමය, මිරිසවැටිය, ජේතවනාරාමය, මිහින්තලය
2. මහා විහාරය, ථූපාරාමය, ඉසුරුමුණිය, මිහින්තලය, අභයගිරිය
3. මහාවිහාරය, ථූපාරාමය, මිරිසවැටිය, ඉසුරුමුණිය, මිහින්තලය
4. මහාවිහාරය, ථූපාරාමය, මිරිසවැටිය, දක්ෂිණගිරිය, මිහින්තලය
5. මහාවිහාරය, ථූපාරාමය, මිරිසවැටිය, රත්න ප්‍රාසාදය, දක්ෂිණගිරිය

38. වලගම්බා රජු දෙවන වරට රාජ්‍යත්වයට පත්වීමෙන් පසු ඉදිකරන ලද අභයගිරි විහාරය පූජා කරනු ලබන්නේ ,

1. කුපික්කලතිස්ස හිමියන්ට ය.
2. බහුලමත්සුතිස්ස හිමියන්ට ය.
3. උස්සිලියාතිස්ස හිමියන්ට ය.
4. කොහොන්තිස්ස හිමියන්ට ය.
5. මහදැලියාතිස්ස හිමියන්ට ය.

39. අලුත උපන් දරුවෙකුගේ ගෙලෙහි පංචායුධය, ධර්ම චක්‍රය, බෝපත්‍රය ආදී ආකෘති කරවා පැළඳීම ලාංකික බෞද්ධයින්ගේ චාරිත්‍ර විදියක් විය. එහි ප්‍රධානතම අපේක්ෂාව වූයේ,

1. දරුවා බෞද්ධයකු බවට පත් කිරීමයි.
2. දරුවා තුළ ශාසන මාමකත්වය ඇති කිරිමයි.
3. දරුවා තුළ ශ්‍රද්ධාව වැඩි දියුණු කිරීමයි.
4. දරුවා විවිධ උවදුරු වලින් ආරක්ෂා කර ගැනීමයි.
5. දරුවාට දේවාශිර්වාදය ලබා දීමයි.

40. බුරුම බෞද්ධ ශිෂ්ටාචාරයේ ඉතිහාසය අනුව එරටට බුදු දහම හඳුන්වාදීම සම්බන්ධයෙන් පවතින මතවාද කිහිපයකි. ඒ අතරින් ස්ථිර වශයෙන්ම එරට බුදු දහම ස්ථාපිතවීම සම්බන්ධයෙන් පවතින පොදු මත වාදය වන්නේ ...................................... වන සියවසේදී බුදු දහම ස්ථාපිත වූ බවයි.

1. ක්‍රි.ව. 10
2. ක්‍රි. ව. 11
3. ක්‍රි.ව. 13
4. ක්‍රි.ව. 15
5. ක්‍රි.ව. 18

41. 13 වන සියවසේදී පිරිහුණු බුදු දහම නඟා සිටුවීම සඳහා ලාංකික භික්ෂූන්ගේ අනුග්‍රහය ඇතිව බුරුම භික්ෂූන් 15666 ක් උපසම්පදා කර බුදු දහම ස්ථාපිත කරමින් කළ්‍යාණි ශිලා ලේඛන පිහිටුවීමට පුරෝගාමී වූයේ,

1. අනුරුද්ධ රජු ය.
2. කෙයංසිත්ථ රජු ය.
3. බෝදෝපයා රජු ය.
4. මින් දොන් මින් රජු ය.
5. ධම්මචේතිය රජු ය.

42. ලොව පරමාදර්ශී සංඝ සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වන තායි සංඝ සංවිධානයේ ප්‍රධානියා ලෙස සලකනු ලබන්නේ,

1. සංඝ මන්ත්‍රී මණ්ඩලයයි
2. උත්තරීතර සංඝ සභාවයි
3. සංඝරාජ වරයායි
4. භික්ෂු කොමසාරිස්වරුන්ය
5. රාජ්‍ය නායකයායි

43. පහත දැක්වෙන ප්‍රකාශ හොඳින් කියවන්න

A - කුලභේදය සමාජයෙන් මුළුමනින්ම ඉවත්වී යාම.

B - කඨින උත්සවයට රජුගේ සහභාගීත්වය අනිවාර්ය විය.

C - ලොකු කුඩා සැම අයෙක්ම බුදුරුව සහිත මාලයක් පැළඳ සිටීම.

D - මොන් අක්ෂර මාලාවේ ආභාෂයෙන් අධ්‍යාපනය දියුණුවීම.

ඉහත ප්‍රකාශ අතරින් තායි සංස්කෘතිය තුළ බුදු දහමේ ආභාෂය ප්‍රකට කෙරෙන වඩාත් නිවැරදි ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.

1. A සහ B
2. A සහ C
3. A සහ D
4. B සහ C
4. B සහ D

44. ක්‍රි.ව. 250 දී විනය කටයුතු සඳහා ධවල අශ්වාරාමයේ සීමා මාලකයක් පිහිටුවා චීනයේ භික්ෂු සසුන ආරම්භ කරන ලද්දේ,

1. ධර්මාකර භික්ෂුව
2 සංඝවර්මන් භික්ෂුව
3. චුපාලන් භික්ෂුව
4. සංඝපාල භික්ෂුව
5. ෆාහියන් භික්ෂුව

45. ඉන්දියාවේ ධර්මාශෝක රජු හා සමාන මෙහෙයක් ජපන් බුදු සමයේ දියුණුව වෙනුවෙන් කරන ලද නිසා ජපානයේ අශෝක යන විරුදාවලිය ලැබූ ජපන් පාලකයා වූයේ

1. කිම්මේයි අධිරාජ්‍යයා ය.
2. ෂෝතෝකුතයිෂි කුමරු ය.
3. සුයිකෝ රැජිණිය ය.
4. උමතෝ සෝගාය.
5. ක්වම්මු අධිරාජ්‍යයා ය.

46. ලොව බොහෝ බෞද්ධ රටවල් මෙන්ම ජපන් බෞද්ධයෝද බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල උත්කර්ෂවත් ලෙස සමරනු ලබති. ඒ අනුව සිදුහත් කුමාරෝත්පත්තිය මුල්කර ගෙන පවත්වන බෞද්ධ උත්සවය වූයේ,

1. ඔබොන් උත්සවය
2. නෙහං උත්සවය
3. ජෝදෝ උත්සවය
4. සෙගකි උත්සවය
5. හනමත්සූරි උත්සවය

47. බුද්ධ ප්‍රතිමාවේ සමාරම්භය සම්බන්ධයෙන් කාලිංග බෝධි ජාතකයේ එන විස්තරයට අනුව බුද්ධ ප්‍රතිමාවක් නෙළීමට බුදුරජාණන් වහන්සේගෙන් අවසරය ලබා ඇත්තේ,

1. බිම්බිසාර රජතුමා ය.
2. කොසොල් රජතුමා ය.
3. ලිච්ඡවී රජවරු ය.
4. අනේපිඬු සිටුතුමා ය.
5. බරණැස් රජතුමා ය.

48. පැරණි බුද්ධ ප්‍රතිමා සම්ප්‍රදායන්ට අයත් ලක්ෂණ කිහිපයක් පහතින් දැක්වේ.

A - මහා කාරුණික ලීලාව

B - නෙත් අඩවන් වීම

C - ආභංග සිරුර

D - හිසකෙස් ස්වභාවිකය

E - ඉතා දුහුල් චීවරය

ඉහත ප්‍රතිමා ලක්ෂ අතරින් ගණ්ධාර සම්ප්‍රදායේ ප්‍රතිමා ලක්ෂණ සහිත නිවැරදි වරණය තෝරන්න.

1. D පමණි
2. A සහ B පමණි
3. A, B, C පමණි.
4. A, B, C, D පමණි.
5. A, B, C, D, E යන සියල්ලමය.

49. ලාංකික ස්තූපයේ ස්තූපාංග හා බැඳුනු සංකේතාර්ථ වලට අනුව කොත් කැරැල්ලෙන් සංකේතවත් කරනු ලබන්නේ කුමක්ද ?

1. සුවාසූ දහසක් ධර්මස්කන්ධය
2. සත්තිස් බෝධි පාක්ෂික ධර්ම
3. නවංග ශාස්තෘ ශාසනය
4. චතුරාර්ය සත්‍ය
5. සතරවරම් දෙවිවරු

50. ලාංකික ගීත සාහිත්‍ය තුළ බෞද්ධ ආභාෂය ප්‍රකට වන ගීත ඛණ්ඩ හතරක් පහතින් දැක්වේ.

A - පාරමිතා බල පූරිත පූජිත ....

B - සඳ වතුරක් සේ මෙත්සොම් ගුණෙනා .......

C - රජෙකු වුනත් ගිලන් වෙලා .....

D - සොර දෙටුවෙක් කස තැලුම් කකා ...

ඉහත ගීත අතරින් බෞද්ධ ඉගැන්වීම් තේමා කරගත් ගීත දෙකක් වන්නේ,

1. A සහ B
2. A සහ C
3. A සහ D
4. B සහ C
5. C සහ D